**ශීර්ෂය 418 - බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි /ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේදී ස්ථාපිත වී ඇති බැවින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික වත්කම් අත්පත්කර ගැනීම්වල වටිනාකම ACA-6හි දැක්වෙන පරිදි රු. 854,029 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් අත්පත්කර ගැනීම්වල වටිනාකමට මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ වියදම හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශයේ ප්‍රාග්ධන වියදම එකතු කර රු.190,586,601 ක් ලෙස දැක්වීමෙන් එම වටිනාකම රු.189,732,572 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, එම හේතුවෙන් සහනාධාර හා මාරුකිරීම්වල වටිනාකම රු. 189,386,542 කින් හා පුද්ගල පඩිනඩි, මෙහෙයුම් වියදම් රු. 346,029කින් අඩුවෙන්ද පෙන්නුම් කෙරිණි. | ඉදිරියේදී අදාල වියදම් වර්ගීකරණයන් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලයෙහි වියදම් ඇතුලත් කරන ලෙසට අදාල නිලධාරීන් හට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු බව. |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු. 97,975 ක මුදලකට විකුණන ලද කාර්යාලීය උපකරණ , පරිගණක උපාංග සහ යන්ත්‍ර හා පිරියත යන වත්කම්වල පිරිවැය වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ගිණුමට හා දේපල පිරියත හා උපකරණ සංචිත ගිණුමට ගැළපීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී රු. 97,975 ක මුදලකට විකුණන ලද කාර්යාලීය උපකරණ, පරිගණක උපාංග සහ යන්ත්‍ර හා පිරියත යන වත්කම්වල පිරිවැය වටිනාකම මූල්‍ය නොවන වත්කම් ගිණුමෙන් හා දේපල පිරියත හා උපකරණ සංචිත ගිණුමෙන් ඉවත් කරන ලෙසට අදාල නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී. | නිවැරදිව ගිණුම්වල ගැළපීම් කළ යුතු බව. |
| (ආ) | වෙනත් ආයතන වෙත නිත්‍යානුකූලව පවරා දී තිබුණු වාහන 4ක වටිනාකම රු. 45,200,000 ක් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්වලින් හා දේපළ පිරියත හා උපකරණ සංචිතයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනත් ආයතන වෙත නීත්‍යානුකූලව පවරා දී ඇති වාහන, මූල්‍ය නොවන වත්කම්වලින් හා දේපළ පිරියත හා උපකරණ සංචිතයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන් හට උපදෙස් දෙන ලදී. | -එම- |
| (ඇ) | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශයේ ප්‍රාග්ධන මාරුකිරීම් වටිනාකම වූ රු. 288,513,580 ක ඇතුළත් මූලධන වත්කම් අත්පත් කරගැනීම්වල වටිනාකම ජ'නල් සටහන් මඟින් මූල්‍ය නොවන වත්කම් ගිණුමට හා දේපල පිරියත හා උපකරණ සංචිත ගිණුමට ගැළපීමට කටයුතු කර නොතිබුණි. | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම්වල වටිනාකම් එම කාර්යාංශය පෙර පැවති අමාත්‍යාංශ යටතේ හෝ ගිණුම්ගත වී නොමැත. එසේ වුවද, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි උපදෙස් ලබා ගෙන ඉදිරියේදී එම කාර්යාංශයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම්වල වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ගිණුමට හා දේපළ පිරියත හා උපකරණ සංචිත ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන් හට උපදෙස් දෙන ලදී. | -එම- |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) පරිදි ඇප ලේඛනයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දෙන ලදී. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු බව. |
| (ආ) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | දැනට පවත්වා ගෙන යන විදුලි උපකරණ ලේඛනය යාවත්කාලීන කිරීමටත් උපදෙස් ලබා දෙන ලදී | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 2ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් රු.150,000 ක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීම් සිදු කිරිමෙන් අනතුරුවද, සියයට 63ක හා සියයට 73 ක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | අපේක්ෂා කළ පරිදි ආහාරපාන හා නිල ඇඳුම් සහ ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් උද්ගත නොවූ නිසා ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | මුදල් ප්‍රතිපාදන නියමිත පරිදි සැලසුම් කර ඉල්ලුම් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ)පුනරාවර්තන වැය විෂයයක හා ප්‍රාග්ධන වැය විෂයයකට වෙන් කරන ලද රු.650,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | • දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරිවීම් රඳවා ගෙන ඇත.<br>• ගරු ඇමතිතුමා හා එම කාර්ය මණ්ඩලය සඳහා වෙන් කරන ලද වාහන සඳහා මූලධන ස්වරූපයේ වියදම් උද්ගත නොවූ නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට පැවති බැරකම් වටිනාකම රු. 28,633,779 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු. 8,313,297 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් කන්දකාඩු හා සේනපුර මධ්‍යස්ථානවල රැඳවියන් හා නිලධාරීන් හට කොරෝනා ආසාදනය වීම නිසා විෂබීජ සහිත ලිපි ලේඛන සෘජුව ලබා ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයන් ඇතිවීම නිසා එම බැරකම් විසර්ජන ගිණුමට ඇතුළත් වී නොමැති බව නිරීක්ෂණය කරමි. | බැරකම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 හා 4.2 ඡේදයන්හි සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලු කාර්ය මණ්ඩලය ලබා දුන් වහාම අභ්‍යන්තර විගණන ඒකකයේ වැඩ කටයුතු ආරම්භ කළ හැකි බව දන්වමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 (2) හා (3) | වර්ෂ 2 ඉක්මවූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත්, 6000/0/0/016/0/055 දරන තැන්පතු ගිණුමේ තැන්පත් කොට තිබූ වර්ෂ 2 ඉක්මවූ තැන්පතු මුදල් රු.4,550,943 ක් රාජ්‍ය ආදායමට බැර කිරිමට කටයුතු කර නොතිබුණි. | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලයට අදාල රුඳවුම් මුදල් ඉදිරියේදී රාජ්‍ය ආදායමට බැර කරන ලෙසට අදාල නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ)2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ඡේදය | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ සහතික විය යුතු වුවද, 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී කොවිඩ් 19 වසංගතය හමුවේ පුද්ගලයන් ඒකරාශී කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බැවින් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් නොපවත්වන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛයේ 23 හා 24 ඡේද | වැඩ හා කුලී අත්තිකාරම් ශේෂ පවරාගනු ලබන වැය ශීර්ෂ විසින් එම ශේෂ ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් තම වැය ශීර්ෂ යටතේ වෙන වෙනම ගිණුම් අංකයක් ලබාගෙන ගිණුම්ගත කළ යුතුයි. එසේ වුවද, අමාත්‍යාංශයේ ගොඩනැගිලි කුලී අත්තිකාරම් රු.6,600,000 ක් හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ වැඩ අත්තිකාරම් මුදල් රු. 33,456,588ක්ද ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලි කුලී අත්තිකාරම් ගෙවන අවස්ථාවේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා ගිණුම් අංක ලබා ගත යුතුය. පසු වර්ෂයන්හීදී ගිණුම් අංක ලබා නොදෙන බැවින් අත්තිකාරම් මුදල් ආපසු ලබා ගන්නා අවස්ථාවේදී රජයේ ආදායමට බැර කරන ලෙසට උපදෙස් ලැබී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.5 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනමට ලක්වූ නිළධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂයන් වන රු. 229,320 ක මුදල වසර 05 කට වැඩි කාලයක් ගතවී ඇතත් එම ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගේ ණය ශේෂ අය කිරීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇත. | නියමිත කාල සීමාව තුළදී ණය ශේෂ අයකර ගත යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් සේනපුර හා කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානවල නේවාසිකාගාර ඉදිකිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින රු. 7,529,768 ක අත්තිකාරම් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව ආරම්භ කළ ඉදිකිරීම් කටයුත්තක් බැවින් ඒ අනුව අත්තිකාරම් මුදල් ගෙවා ඇති බවත් ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුවත් කාර්යාංශය වරින් වර අමාත්‍යාංශ 4ක් යටතට පත්වීමත් හේතුවෙන් සංවර්ධන කටයුතු අඩාල වී ඇති බවත් නිරීක්ෂණය කරමි. | නිත්‍යානුකුල කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු බව. |

මුදල් ගෙවා තිබුණි. ගිවිසුම්ගත වීමට ප්‍රථම ඉදිකිරීම් භූමියේ අයිතිය නිත්‍යානුකූල පවරාගැනීමකින් හා ගොඩනැගිලි සැලසුම් අනුමත කරවාගැනීමකින් තොරව වැඩ ආරම්භ කිරීම හේතුවෙන් අතරමඟ ඉදිකිරීම් කටයුතු නතර කිරීමට සිදුවී තිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන චක්‍රලේඛයේ 2 (i) ඡේදය ප්‍රකාරව වාහනවල අයිතිය විධිමත්ව පවරා දීමට කටයුතු කළයුතු වේ. එහෙත් අමාත්‍යාංශය සතුව පැවති වටිනාකම රු. 84,400,000 ක් වූ වාහන 13 ක් 2019 වර්ෂයේදි බාහිර ආයතන වෙත මුදාහැර තිබූ අතර එයින් බොහොමයක් වාහන වසරකට වැඩි කාලයක් ගත වී තිබුණත් එහි නිත්‍යානුකූල අයිතිය එම ආයතන වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය යටතේ පවතින වාහන මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමටත් අනෙකුත් වාහන ඒ ඒ කාර්යාල වෙත ලබා දීමටත් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. එම අනුමැතිය ලද වහාම සියලුම වාහන නීත්‍යානුකූලව පැවරීමේ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | අමාත්‍යාංශය සතු රු. 8,550,000ක් වටිනා වාහන 3 ක් වසරකට වැඩි කාලයක් ඌන උපයෝජිතව අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ගාල්කර තිබුණද, ඒවා | අමාත්‍යාංශය සතු මෙම වාහන ධාවනය කිරීමට නොහැකිව අළුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින බැවින් අළුත්වැඩියා කිරීමට වැය වන වියදම ඇස්තමේන්තු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවීමට කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. මේ අනුව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2020 ඔක්තෝබර් මස 02 දිනැති අංක 05/2020 චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන තෙක් කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය දක්වමින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. එසේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලු කාර්ය මණ්ඩලයට අනුමැතිය ලබා දුන් වහාම අභ්‍යන්තර විගණන ඒකකයේ වැඩ කටයුතු ආරම්භ කළ හැකි බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 05.3 ඡේදය පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලු කාර්ය මණ්ඩලය ලබා දුන් පසු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය හැකි බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 73 ක්ද,තථ්‍ය කාර්ය මණ්ඩලය 61 ක්ද වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 12 ක් විය. මේ තුල ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබූ බැවින් එය අමාත්‍යාංශයේ කාර්යසාධන ඉලක්ක ළගාකර ගැනීම කෙරෙහි බලපෑමක් ඇතිවිය හැක. | පුරප්පාඩු තනතුරු පිළිබඳව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | අනුමත කාර්යමණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. |